සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - I

**නම/විභාග අංකය :-** .................................................................................... **කාලය : පැය 3යි**

**i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.**

**ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලදී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

- **පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

කාන්තා ජනගහනය ඉහළ ප්‍රදේශයක කාන්තා නිමි ඇඳුම් ව්‍යාපාරයක් මල්කා හා නිමල්කා විසින් පවත්වාගෙන යති. ව්‍යාපාරික නාමය 'ගෝල්ඩ් ටෙක්ස්' නමින් පවත්වාගෙන යාමට අපේක්ෂා කරති.

1. නිමි ඇඳුම් අලෙවිය තුළින් සපුරාලන්නේ කාන්තාවන්ගේ,

1. අපේක්ෂාවකි. 2. අවශ්‍යතාවකි 3 වුවමනාවකි 4. රුචිකත්වකි.

2. මෙම ව්‍යාපාරයේ ඉලක්ක වෙළඳපොල කොටස වනුයේ,

1. කාන්තාවන්ය. 2. නිමි ඇඳුම්ය 3. ඉහළ ආදායම්ලාභීන්ය. 4. ප්‍රාදේශීය වෙළඳපොළය

3. ඉහළ ජනගහණයක් පැවතීම

1. අවස්ථාවකි. 2. තර්ජනයකි. 3. ශක්තියකි. 4. අභියෝගයකි.

4. ගොල්ඩ් ටෙක්ස් ව්‍යාපාරය,

1. හවුල් ව්‍යාපාරයකි. 2. කේවලස්වාමී ව්‍යාපාරයකි
3. සමිති සංවිධාන ව්‍යාපාරයකි. 4. සංස්ථාපිත ව්‍යාපාරයකි.

5. ගැනුම් හා විකුණුම් මත 15% ක එකතු කළ අගය මත බද්දක් (VAT) පැනවීම රජයේ තීරණයකි. මෙය අයත් වනුයේ,

1. ආර්ථික පරිසරයටය 2. ගෝලීය පරිසරයටය 3. තාක්ෂණික පරිසරයටය 4. නෛතික පරිසරයටය

6. මිනිස් අවශ්‍යතා හා මිනිස් වුවමනා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න

| | මිනිස් අවශ්‍යතා | මිනිස් වුවමනා |
|---|---|---|
| 1. | විවිධ වේ | පොදු වේ |
| 2. | අසීමිත වේ | පොදු වේ. |
| 3. | සීමිත වේ | විවිධ වේ |
| 4. | සංකීර්ණ වේ | නිර්මාණය කළ හැකි වේ. |

- **7 හා 8 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී පහත විස්තරය සැලකිල්ලට ගන්න.**

තම පියාගෙන් උරුම වූ රු 800000 වටිනා ගොඩනැගිල්ලක් සමන් විසින් පාවහන් නිෂ්පාදනය සිදු කරනු ලබයි. නිෂ්පාදන කටයුතු සඳහා පුහුණු ශ්‍රමිකයන් දෙදෙනෙකුගේ සහභාගීත්වය පවතී.

7. නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරනු ලබන ගොඩනැගිල්ල අයත්වන නිෂ්පාදන සාධකය,

1. භූමිය වේ. 2. ශ්‍රමය වේ. 3. ප්‍රාග්ධනය වේ. 4. ව්‍යවසාය වේ.

8. ''සනීපා පාවහන්'' ලෙස ව්‍යාපාරික නාමය පවත්වා ගැනීමේදී ලියාපදිංචි කිරීමේ සහතිකය ලබාගත යුත්තේ,

1. අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි
2. අදාළ ප්‍රාදේශිය සභාවෙනි
3. සමාගම් රෙජිස්ටාර් කාර්යාලයෙනි
4. කාර්මික සංවර්ධන මණ්ඩලයෙනි

9. පියල් මාතර බෙලිඅත්ත දුම්රියේ ගමන් කරන මගීන්ට රටකජු විකිණීම සිදු කරයි. මෙය,

1. ඍජු වෙළඳාමකි
2. සිල්ලර වෙළඳාමකි
3. තොග වෙළඳාමකි
4. අතරමැදි වෙළඳාමකි

10. සන්නිවේදන ක්‍රියාවලියක මූලිකාංගවලින් කිහිපයක් අනුපිළිවෙලින් පහත දක්වා ඇති අතර A ස්ථානයේ තිබිය යුතු මූලිකාංගය කුමක් ද?

යවන්නා → A → මාධ්‍යය → ලබන්නා

1. ප්‍රතිපෝෂණය වේ
2. පණිවිඩය වේ
3. ප්‍රතිචාරය වේ
4. ග්‍රාහකයා වේ

11. රක්ෂණයේ පදනම වනුයේ,

1. සිදු වූ හානියට වන්දි ගෙවීමයි.
2. රක්ෂණ සමාගම් ලාභ ඉපයීමයි.
3. අවදානම් ඒකරාශී කිරීමයි.
4. අවදානම් ඉවත්කරලීමයි.

12. බැංකු ගිණුමේ ඇති මුදල්වලින් ඍජුවම ගෙවීම් කිරීමට හැකිවන පරිදි වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ට නිකුත් කර ඇති කාඩ්පත් විශේෂය වනුයේ,

1. ණයපත්‍ය.
2. හරපත්‍ය.
3. වීසා කාඩ්පත්‍ය.
4. පෙරගෙවුම් කාඩ්පත්‍ය.

13. ''අධික වර්ෂාවත් සමග නායයාමකට ලක් වූ ප්‍රදේශයක අවතැන් වූ හා රෝගී තත්ත්වයට පත් වූ ජන කොට්ඨාශයක් සඳහා ආහාර ඖෂධ හා වෛද්‍ය උපකරණවල දැඩි අවශ්‍යතාවය පවතී.'' අදාළ ද්‍රව්‍ය ඔවුන් වෙත ලබාදීමට තෝරා ගත යුත්තේ,

1. දුම්රිය මාර්ග ප්‍රවාහනයයි
2. මහා මාර්ග ප්‍රවාහනයයි
3 ජල මාර්ග ප්‍රවාහනයයි
4. ගුවන් මාර්ග ප්‍රවාහනයයි.

- **14 හා 15 යන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් විස්තරය සැලකිල්ලට ගන්න.**

''හංසලී සී/ස නාඔටුන්න පොදු සමාගමෙන් මිලදී ගෙන තිබූ රු 20 වූ සාමාන්‍ය කොටස් 2500 එකක් රු 30 බැගින් විකුණයි''

14. සී/ස නාඔටුන්න පොදු සමාගම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පිළිතුරුවලින් සාවද්‍ය පිළිතුර තෝරන්න.

1. සමාගම ලියාපදිංචි කර ඇත්තේ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේය.
2. අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලන කටයුතු සිදු කරනු ලබයි.
3. සමාගමේ කොටස් මිලදීගත් අයෙකුගේ වගකීම තමා මිලදී ගත් කොටස්වල වටිනාකම දක්වා සීමා වේ.
4. නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන ප්‍රභේදයකි.

15. හංසලී තම සාමාන්‍ය කොටස් විකිණීමෙන් ලැබූ ප්‍රාග්ධන ලාභය,

1. රු 50000 කි
2. රු 75000 කි
3. රු 25000 කි
4. රු 100 000 කි

16. මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා වටිනාකමින් යුත් නිෂ්පාදිතයන් නිර්මාණය කිරීමේ හා පිළිගැන්වීමේ ක්‍රියාවලිය

1. ප්‍රවර්ධනයයි
2. අලෙවිකරණයයි
3. නවෝත්පාදනයයි.
4. නිර්මාණශීලීත්වයයි

17. ගිණුම්කරණයේ මූලික අරමුණ.

1. ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ ගණනය කිරීම වේ.
2. ව්‍යාපාරික ගනුදෙනු නිසි පරිදි වාර්තා කිරීම වේ.
3. ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායකද යන්න පරීක්ෂා කිරීම වේ.
4. තීරණ ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු ඇල්මැති පාර්ශ්වවලට සැපයීම වේ.

18. ණය හිමියන්ට ගෙවිය යුතු රු 15000 ව්‍යාපාරයේ හිමිකරු විසින් තම පෞද්ගලික මුදලින් ගෙවූ විට

1. ව්‍යාපාරයේ හිමිකම්වල වැඩිවීමක් සිදුවේ.

2. ව්‍යාපාරයේ වගකීම්වල අඩුවීමක් සිදුවේ

3. ව්‍යාපාරයේ වත්කම්වල වැඩිවීමක් හා වගකීම්වල අඩුවීමක් සිදු වේ.

4. ව්‍යාපාරයේ හිමිකම්වල වැඩිවීමක් හා වගකීම්වල අඩුවීමක් සිදුවේ.

19. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන, අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ ව්‍යාපාරය විසින් පාලනය කරනු ලබන සම්පත්,

1. හිමිකම් වේ　　2. වත්කම් වේ　　3. මුදල් වේ　　4. වගකීම් වේ

20. ''වැඩිවීම'' හරටත් ''අඩුවීම'' බැරටත් සටහන් වන ගිණුම් වර්ග

1. වත්කම් හා වියදම් ගිණුම් වේ.　　2. ආදායම් හා වත්කම් ගිණුම් වේ.

3. හිමිකම් හා වියදම් ගිණුම් වේ.4.　　වත්කම් හා ආදායම් ගිණුම්වේ.

- **පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින් 21 සිට 23 දක්වා පිළිතුරු සපයන්න.**

2019. 06. 01 දිනට කල්පනී ව්‍යාපාරයේ තොරතුරුවලින් සමහරක් පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| යන්ත්‍ර උපකරණ | 150000 |
| වෙළඳ තොග | 30000 |
| මුදල් | 60000 |
| ණය හිමියෝ | 40000 |

2019. 06. 07 න් අවසන් වූ සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

A විකිණීම සඳහා රු 15000 භාණ්ඩ තොගයක් තාරකාගෙන් (ණයට) ලබා ගැනීම

B ණයහිමියන්ට රු 2000 කට ණය ගෙවීමේදී 10% ක වට්ටමක් ලැබීම

C යන්ත්‍ර උපකරණවලින් රු 3000 ක ප්‍රමාණයක් ක්ෂය වීම

D රු 12000 ක පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු 200000 ක විකිණීම

21. ව්‍යාපාරයේ හිමිකම් වැඩිවීමට බලපාන ගනුදෙනු වනුයේ

1. B හා C ය.　　2. A හා B ය.　　3. B හා D ය.　　4. B C හා D ය.

22. 2019. 06. 01 දිනට ව්‍යාපාරයේ ප්‍රාග්ධනය

1. රු 140000 කි　　2. රු 200000 කි　　3. රු 240000 කි　　4. රු 280000 කි

23. A, B, C, D යන ගනුදෙනුවල බලපෑමෙන් පසු ව්‍යාපාරයේ වත්කම්, හිමිකම්, වගකීම්වල අගයන් වනුයේ,

| | වත්කම් රු | හිමිකම් රු | වගකීම් රු |
|---|---|---|---|
| 1. | 255000 | 200000 | 55000 |
| 2. | 240000 | 205000 | 35000 |
| 3. | 242000 | 207000 | 35000 |
| 4. | 254000 | 219000 | 35000 |

24. 2019. 06. 30 න් අවසන් වූ මාස තුන තුළ ව්‍යාපාරයේ හිමිකම් රු 8000 ද වගකීම් රු 3000 කින් ද වැඩි වී ඇත්නම්

1. ව්‍යාපාර වත්කම්වල කිසිදු වෙනසක් සිදුවී නැත
2. ව්‍යාපාරයේ වතක්ම් රු 5000 කින් වැඩි වී ඇත.
3. ව්‍යාපාරයේ වත්කම් රු 8000 කින් වැඩි වී ඇත
4. ව්‍යාපාරයේ වත්කම් රු 11000 කින් වැඩි වී ඇත.

25. කාලච්ඡේදයේ විකුණුම් ජ,නලයේ එකතුව

1. ණයගැති ගිණුමට බැර කරනු ලබයි
2. විකුණුම් ගිනුමට බැර කරනු ලබයි
3. විකුණුම් ගිණුමට හර කරනු ලබයි
4. ආදායම් ප්‍රකාශනයට හර කරනු ලබයි

- **අංක 26 හා 27 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන විස්තරය සැලකිල්ලට ගන්න.**

2019. 07. 01 දින ලක්මාල් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා චන්දිමාල්ගෙන් එකක් රු 50000 බැගින් ආරක්ෂිත කැමරා දෙකක් ණය පදනම යටතේ ලබාගෙන ඇත.

26. ඉහත ගනුදෙනුව හා සම්බන්ධ මූලාශ්‍ර ලේඛනය

1. ගෙවීම් වවුචරය වේ.
2. ජ'නල් වවුචරය වේ.
3. ගැනුම් ඉන්වොයිසිය වේ.
4. පිලිපත වේ.

27. ඉහත ගනුදෙනුවට අදාළ තොරතුරු වාර්තා කරන මූලික සටහන් පොත

1. පොදු ජ'නලය වේ.
2. ගැනුම් ජ'නලය වේ.
3. මුදල් පොත වේ.
4. බැංකු ගිණුම වේ.

28. සුළු මුදල් අග්‍රිමය ලෙසට ලැබූ රු 8000 සුළු මුදල් පොතේ සටහන් කිරීමේදී භාවිත කරන මූලාශ්‍ර ලේඛනය

1. ලදුපත වේ.
2. ගෙවීම් වවුචරය වේ.
3. ඉන්වොයිසිය වේ.
4. සුළු මුදල් වවුචරය වේ.

- **29 හා 30 හා 31 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් විස්තරය සැලකිල්ලට ගන්න.**

2018. 01. 01 දින ''මල්කි'' ව්‍යාපාරය විසින් මිලදී ගත් මෝටර් රථයකට අදාළ තොරතුරු පහත පරිදි වේ.

| | |
|---|---|
| පිරිවැය | රු 900000 |
| සුංබුං අගය | රු 100000 |
| ඵලදායී ජීව කාලය | අවු 10 |

සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි. ගිණුම් කාලය 2018. 12. 31 න් අවසන් වේ.

29. මෝටර් රථයේ ක්ෂය කළ හැකි අගය

1. රු 100000 කි
2. රු 900000 කි
3. රු 800000 කි
4. රු 1000 000 කි

30. මෝටර් රථයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය

1. රු 10000 කි
2. රු 90000 කි
3. රු 80000 කි
4. රු 100000 කි

31. 2018. 12. 31 දිනය පිළියෙල කරන මූල්‍ය තත්ව ප්‍රකාශනත් ඇතුළත් කරන මෝර් රථයේ ධාරණ අගය

1. රු 820000 කි
2. රු 720000 කි
3. රු 880000 කි
4. රු 900000 කි

32. බැංකුව විසින් ව්‍යාපාරයකට එවනු ලබන බැංකු ප්‍රකාශයක දක්නට නොලැබෙන අයිතමයක් වන්නේ.

1. ස්ථාවර නියෝග අනුව සිදුකළ ගෙවීම්
2. අය කළ බැංකු ගාස්තු
3. නිකුත් කළ චෙක්පත්වලට සිදු කළ ගෙවීම්
4. තැන්පත් කිරීමට යැවූ චෙක්පත්වල වටිනාකම්

● **33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගන්න.**

2019. 06. 30 න් අවසන් වූ මාසයට අදාළව "දිල්කි" ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හර තීරුවේ එකතුව රු 81000 ද බැර තීරුවේ එකතුව රු 62000 ද වේ.

2019 ජුනි මාසය සඳහා බැංකුවෙන් එවා ඇති බැංකු ප්‍රකාශයේ පහත සඳහන් කරුණු අනාවරණය වේ.

ව්‍යාපාරයේ බැකු ගිණුමේ සටහන් නොවූ එහෙත් බැංකුවට සෘජුව ලැබී ඇති ලාභාංශ ආදායම රු 8500 කි

ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් නොවූ එහෙත් බැංකුව විසින් ගිණුමෙන් අයකරගෙන තිබෙන චෙක්පොත් ගාස්තුව රු 2000 කි

ජුනි මාසය තුළ ව්‍යාපාරය විසින් නිකුත් කරන ලද චෙක්පත්වල වටිනාකම රු 28000 ක් වුව ද බැංකුවට ඉදිරිපත් කර මාරු කරගෙන තිබූ චෙක්පත් වටිනාකම රු 24000 කි.

ඉහත සිද්ධියට අනුව,

33. 2019. 06. 30 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය

1. රු 19000 ක හර ශේෂයකි
2. රු 27500 ක හර ශේෂයකි
3. රු 25500 ක හර ශේෂයකි
4. රු 22000 ක හර ශේෂයකි.

34. ජුනි මාසය සඳහා බැංකුවෙන් එවා ඇති බැංකු ප්‍රකාශනයේ 2019. 06. 30 දිනට සඳහන්ව ඇති ශේෂය

1. රු 21500 ක වාසිදායක ශේෂයකි
2. රු 22500 ක වාසිදායක ශේෂයකි
3. රු 21000 ක වාසිදායක ශේෂයකි
4. රු 29500 ක වාසිදායක ශේෂයකි

● **35 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත තොරතුරු සැලකිල්ලට ගන්න.**

2018. 12. 31 දිනට පුන්සිසි ව්‍යාපාරයෙන් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| විකුණුම් | 680000 |
| වෙනත් ආදායම් | 16000 |
| 2018. 01. 01 දිනට ප්‍රාග්ධනය | 500000 |
| ලැබූ වට්ටම් | 7000 |
| ණය හිමියෝ | 24000 |
| බැංකු අයිරාව | 20000 |
| විකුණුම් පිරිවැය | 425000 |
| යන්ත්‍ර උපකරණ | 240000 |
| ගොඩනැගිලි | 400000 |
| ණයගැතියෝ | 39000 |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 45000 |
| කඩකුලී | 24000 |
| රක්ෂණ ගාස්තු | 8000 |
| මුදල් | 30000 |
| 2018. 12. 31 දිනට වෙළඳ තොරතුරු | 36000 |

අතිරේක තොරතුරු:

2018. 01. 01 දින මිලදී ගත් යන්ත්‍ර උපකරණවල පිරිවැය රු 240000 ලෙස ඉහත දක්වා ඇති අතර ඵලදායී ජීව කාලය වර්ෂ 10 ක් ද සුංබුන් අගය රු 40000 ද වේ. සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු වේ.

35. 2018. 12. 31 න් අවසන් වර්ෂයේ දළ ලාභය වන්නේ,

1. රු 262000 කි
2. රු 278000 කි
3. රු 255000 කි
4. රු 233000 කි

36. 2018. 12. 31 න් අවසන් වර්ෂයේ ආදායම්වල එකතුව වන්නේ,

1. රු 680000 කි 2. රු 803000 කි 3. රු 687000 කි 4. රු 233000 කි

37. කාලච්ඡේදයේ ආයතන හා පරිපාලන වියදම්වල එකතුව කොපමණ ද?

1. රු 52000 කි 2. රු 32000 කි 3. රු 69000 කි 4. රු 97000

38. 2018. 12. 31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණ ද?

1. රු 620000 කි 2. රු 640000 කි 3. රු 580000 කි 4. 660000 කි

39. 2018. 12. 31 වන විට හිමිකමේ සිදු වූ ශුද්ධ වැඩිවීම කොපමණ ද?

1.රු 225000 2. රු 181000 3. 201000 4. 681000

40. 2018. 12. 31 දිනට හිමිකම් හා මුළු වත්කම්වල වටිනාකම දැක්වෙන පිළිතුර තෝරන්න.

| | හිමිකම් රු | මුළු වත්කම් රු |
|---|---|---|
| 1. | 281000 | 660000 |
| 2. | 286000 | 785000 |
| 3. | 681000 | 765000 |
| 4. | 681000 | 725000 |

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය - II

නම/විභාග අංකය :- .................................................................................. කාලය : පැය 02 යි

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලි අත්අකුරින් ලියන්න

01. **පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

විසිත, ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර පරිසර විශ්ලේෂණයක නිරත විය. එහිදී කාන්තාවන් වැඩි දෙනෙකු රැකියා සඳහා යොමු වී තිබීම, තරුණ පාර්ශ්වය නව විලාසිතා කෙරෙහි වැඩි ඇල්මකින් කටයුතු කිරීම, ආර්ථිකය තුළ මිල මට්ටම ඉහළ යමින් පැවතීම, බැංකු ණය පොලී අනුපාතය ඉහළ යාම යනාදි තත්ත්වයන් හඳුනා ගැනීමට හැකි විය.

විදේශීය රටක සිට පැමිණි විසිතගේ මිතුරෙකු වූ රසික සමග එක්ව නවීන විලාසිතායෙන් යුතු ඇඳුම් පැළඳුම් නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට විසිත කටයුතු කළේය. ඒ අනුව තම පියාගෙන් ලැබුණු රු 500000 වටිනා ගොඩනැගිල්ල යොදවා ගැනීමත් රු 300000 බැගින් දෙදෙනා මුදල් යෙදවීමෙන් 2019.01.01 දින ව්‍යාපාරය ආරම්භ කරනු ලැබීය. ඇඳුම් මැසීමේ මහන මැෂින් ලබා ගැනීම සඳහා රු 400000 ක බැංකු ණයක් 2019. 01. 05 දින ලබා ගැනීමට හැකි විය.

2019. 03. 31 න් අවසන් වූ කාලසීමාවට අදාළව පහත තොරතුරු ද සපයා ඇත.

| | | | රු |
|---|---|---|---|
| මිලදී ගත් මහන මැෂින් හා වෙනත් උපකරණ | | | 260000 |
| රෙදි නූල් හා වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීම | | | |
| | අත්පිට මුදලට | 230000 | |
| | ණයට | 70000 | 300000 |
| නිෂ්පාදන වැටුප් ගෙවීම | | | 75000 |
| කම්හල් විදුලිය සඳහා | | | 24000 |
| අලෙවි කිරීමේ වියදම් | | | 46000 |
| කාර්යාලයීය ලී බඩු | | | 20000 |
| විකුණුම් ආදායම | | | 875000 |

2019. 03. 31 දිනට අමුද්‍රව්‍ය හෝ නිමි ඇඳුම් කිසිවක් ඉතිරි වී නැත.

(i) ව්‍යාපාර පරිසරය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

(ii) විසිත විසින් අධ්‍යයනය කළ ව්‍යාපාර පරිසර සාධක දෙකක් සඳහන් කර ඊට නිදසුන බැගින් දක්වන්න.

(iii) විසිත රසික සමග එක්ව ආරම්භ කළ ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කර එහි පැවැත්ම ගැන ඔබට කුමක් කිව හැකි ද?

(iv) ''ක්ලැසිකල් ෆැෂන්'' නමින් ව්‍යාපාරික නාමය පවත්වා ගැනීමට අදාළ නීතිමය තත්ත්වය පැහැදිලි කරන්න.

(v) (අ) 2019. 01. 01 දිනට ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද?

(ආ) 2019. 01. 05 දිනට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය වත්කම්=හිමිකම්+වගකීම් යන සමීකරණයෙන් පෙන්නුම් කරන්න

(vi) මෙම ව්‍යාපාරයේ නිෂ්පාදන ස්ථාවර වත්කම් හා ඒවායේ එකතුව කොපමණ ද?

(vii) ව්‍යාපාරය විසින් පවත්වා ගත යුතු මූලික සටහන් පොත් දෙකක් නම් කරන්න.

(viii)2019.03.31 න් අවසන් වූ කාල සීමාවට අදාළව නිෂ්පාදන පිරිවැය ලේඛනයක් ඉදිරිපත් කරන්න.

(ix) 2019. 03. 31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

(x) 2019. 03. 31 න් අවසන් වූ කාල සීමාවට අදාළව ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න.

(2x10=20)

## I කොටස

02. (i). මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට සමත් නිෂ්පාදිත බිහි කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තක නිරත වීම ව්‍යාපාර නම් වේ.

(අ) ව්‍යාපාරික අරමුණක් හා පාරිභෝගික අරමුණක් ලියන්න

(ආ) ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්ව දෙකක් නම් කර එලෙස උනන්දුවක් දක්වීමට හේතුවක් ද සඳහන් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද? අසත්‍ය ද? යන්න දක්වන්න.

(අ) වෙළඳාම උපකාරක සේවා හා කර්මාන්ත ව්‍යාපාර සංකල්පය තුළ අන්තර්ගත මූලික කොටස් වේ.

(ආ)හවුල් ව්‍යාපාරයක තිබිය යුතු මූලික අංගය ලාභ ලැබීමේ අරමුණ වේ.

(ඉ) අයිතිය හා පාලනය රජය සතුවීම රාජ්‍ය සංස්ථා ව්‍යාපාරවල මූලික ලක්ෂණයක් වේ.

(ඊ)දේශීය ලොකු ළූණු කිලෝ ග්‍රාමයකට රු 40 ක බද්දක් පැනැවීමට රජය විසින් කටයුතු කිරීම දේශීය ලොකු ළූණු නිෂ්පාදනයාට ලැබෙන අවස්ථාවක් වේ.

(iii) මාතර නගරයේ පාසල් සිසුන්ගෙන් බොහොමයක් පාසල් නිමවීමෙන් පසු මාතර දුම්රිය ස්ථානයේ සිට බෙලිඅත්ත දුම්රිය ස්ථානය දක්වා දුම්රියෙන් පැමිණ තම නිවෙස් වලට ගමන් කරති.

ප්‍රවාහන පද්ධතියක මූලිකාංග හතර නම් කර ඊට අදාළ ඉහත සිද්ධියෙන් නිදසුන බැගින් ඉදිරිපත් කරන්න.

(iv) (අ) ව්‍යාපාර පරිසර සාධක කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| A අයිතිකරුවන් | D සේවකයන් |
| B ගනුදෙනුකරුවන් | E කලමනාකරුවන් |
| C සැපයුම්කරුවන් | F තරගකරුවන් |

ඉහත දැක්වූ පරිසර සාධක අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය යටතේ වර්ගකර දක්වන්න

(ආ) ව්‍යාපාර පරිසරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශ්ව විසින් ව්‍යාපාරවලට සිදු කරන බලපෑම් මූලික කොටස් දෙකකට වෙන් කළ හැකිය. ඒ මොනවා ද? (2x4=8)

03. (i) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරලීම සඳහා ව්‍යාපාර විසින් නිපදවනු ලබන භාණ්ඩ හා සේවා අතර පවත්නා වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

(අ) දැනුවත් බවින් යුතු පාරිභෝගිකයින් සිටීම වර්තමාන ව්‍යාපාර පරිසර ප්‍රවණතාවක් වේ.

(ආ) කේවලස්වාමී ව්‍යාපාරවලට මෙන්ම රජයේ දෙපාර්තමේන්තු ව්‍යාපාරවලට ද නීතිමය පුද්ගල භාවයක් නොපවතී.

(ඉ) සංස්ථාපිත සමාගමක කලමනාකරණ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩල මගින් සිදු කෙරේ.

(ඊ) ජීවිත රක්ෂණ ඔප්පුවක් සඳහා රක්ෂණ හිමිකම් ප්‍රදානය කිරීමේදී හානි පූරණ රක්ෂණ මූලධර්මය සැලකිල්ලට ගනී.

(iii) කුඩා පරිමාණ එළවළු නිෂ්පාදකයකු වූ බැසිත් කාබනික පොහොර යොදා නිපදවූ නැවුම් එළවලු වලින් කොටසක් ගොවිපොළේදී දන්නා හඳුනන අයට විකිණීම සිදු කර අනෙක් කොටස සිල්ලර වෙළඳසැල්වලට විකුණනු ලබයි. බැසිල් විසින් සිදු කරන බෙදාහැරීම් දෙක සඳහන් කර එය හඳුනාගත් ආකාරය ඉහත සිද්ධිය තුළින් ඉදිරිපත් කරන්න.

(iv) ජංගම ගිණුමක් පවත්වා ගැනීමෙන් ව්‍යාපාරිකයකුට ලබා ගත හැකි වාසි හතරක් ඉදිරිපත් කරන්න. (2X4=8)

04. (i) චෙක්පතකට සම්බන්ධ පහත සඳහන් පාර්ශ්ව දෙක කෙටියෙන් හඳුන්වන්න.

(අ) අණකරු (ආ) ආදායකයා

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) නිෂ්පාදනයේදී භාවිත කරන ශ්‍රමය හා ව්‍යවසාය යන සාධක දෙක සජීවී නිෂ්පාදන සාධක වේ.

(ආ) ලංකා බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව රාජ්‍ය අංශයේ පවතින වාණිජ බැංකු වේ.

(ඉ) චෙක් පොතෙන් චෙක් පත්‍රය නිකුත් කිරීමට පෙර අදාළ තොරතුරු පිළිපතේ සඳහන් කිරීම චෙක්පත් රේඛනය කිරීම වේ.

(ඊ) සීමිත පොදු සමාගමක කොටස් මිලදී ගැනීමෙන් ලබන ප්‍රතිලාභයක් ලාභාංශ වේ.

(iii) ''සුරංග රු මිලියන 5 ක් වටිනා ව්‍යාපාරික ගොඩනැගිල්ල සඳහා සී/ස සුරක්ෂා රක්ෂණ සමාගමෙන් රු මිලියන 5 ක ගිනි රක්ෂණය ඔප්පුවක් ලබාගෙන තිබිණි. හදිසියේ ඇති වූ ගිනි ගැනීමක් මත රු මිලියන 2 වටිනා කොටසක් මුළුමනින් ම හානියට පත් විය.''

ඉහත සිද්ධියට අනුව,

(අ) රක්ෂකයා හා රක්ෂිතයා නම් කරන්න.

(ආ) ලබා දුන් රක්ෂණ වන්දිය රු මිලියන 2 ක් නම් ඊට අදාළ වූ රක්ෂණ මූලධර්මය සඳහන් කරන්න.

(iv) ව්‍යාපාරිකයකු භාණ්ඩ ප්‍රවාහනය කිරීමට පෙර ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී අවධානයට යොමු කළ යුතු සාධක හතරක් ලියන්න. (2X4=8)

## II කොටස

05. (i) (අ) ද්විත්ව සටහන් තැබීමේ ගිණුම් ක්‍රමය යනු කුමක් ද?
(ආ) සාමාන්‍යයෙන් බැර ශේෂ පෙන්නුම් කරන ලෙජර ගිණුම් වර්ග දෙකක් ලියන්න. (ල.2)

(ii) තරුලි ළමා නිමි ඇඳුම් මිලට ගෙන නැවත විකිණීම සිදු කරන අතර ව්‍යාපාරයේ ණයට ගැණුම් පිළිබඳව තොරතුරු පහත දක්වා ඇත.

2019. 06. 12 ඉන්වොයිස් අංක 45 යටතේ ගීතාගෙන් එකක් රු 400 බැගින් පිරිමි ළමා ඇඳුම් 20 යි (අඩුකළ වෙළඳ වට්ටම 10%)

2019. 06. 20 ඉන්වොයිස් අංක 82 යටතේ සුනිමල්ගෙන් එකක් රු 500 බැගින් ගැහැණු ළමා ඇඳුම් 40 යි (අඩුකළ වෙළඳ වටට්ම 5%)

2019. 06. 30 දිනට ගැණුම් ජ'නලය පිළියෙල කරන්න. (ල.2)

(iii) (අ) කණිෂ්කා ව්‍යාපාරයේ සිදුවී ඇති පහත සඳහන් ගනුදෙනු නිසා ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම් දක්වන්න.
(වැඩිවීම් + ලෙසටත් අඩුවීම් ලෙසටත්)

2019.06.03 විකිණීම සඳහා රු 12000 ක භාණ්ඩ තොගයක් මානෙල් ව්‍යාපාරයෙන් ණයට මිලදී ගැනීම

2019. 06.08 බැංකු ණය සඳහා (බැංකු ණය පොලී හැර) රු 8000 ක් ගෙවීම

2019.06.12 ව්‍යාපාරයේ විදුලි බිල රු 3000 ක් ගෙවීම

2019.06.18 ණයගැතියන්ගෙන් රු 5000 ක් ලැබීම

| දිනය | භාණ්ඩ තොග | ණයගැතියෝ | මුදල් | හිමිකම් | බැංකු ණය | ණය හිමියෝ |
|---|---|---|---|---|---|---|
| 2019.06.01 | 24000 | 26000 | 35000 | 30000 | 40000 | 15000 |
| 2019.06.03 | | | | | | |
| 2019.06.08 | | | | | | |
| 2019.06.12 | | | | | | |
| 2019.06.18 | | | | | | |

(ආ) 2019.06. 18 දිනට ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය පහත දැක්වෙන සමීකරණයෙන් ඉදිරිපත් කරන්න.
වත්කම් = හිමිකම් + වගකීම් (ල.5)

(iv) සපුමල් ව්‍යාපාරයේ 2019.06.01 දිනට පැවති ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| මුදල් | | 80000 |
| ණයගැති | කල්පනී | 30000 |
| | තාරකා | 20000 |
| ණයහිමි | පියල් | 46000 |
| | අනිල් | 34000 |

සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

2019.06.15 ලදුපත් අංක 35 යටතේ කල්පනීගෙන් ලද මුදල රු. 7 600 අඩුකළ වට්ටම් රු. 400කි.

2019.06.15 ලදුපත් අංක 36 යටතේ තාරකාගෙන් රු 6000 ක ණය ලැබීමේදී අඩු කළ වට්ටම 10% කි

2019.06.18 වච්චර අංක 15 යටතේ පියල්ට ගෙවීම් රු 5700 අඩු කළ වට්ටම රු 300 කි

2019.06.25 වචුචර අංක 16 යටතේ අනිල්ට රු 5000 ක ණය ගෙවීමේදී අඩු කළ වටට්ම 10% කි.

අවශ්‍ය වන්නේ,

(අ) මූලාශ්‍ර ලේඛන අංකද ඇතුළත් වන පරිදි වට්ටම් තීරුව සහිත මුදල් පොත

(ආ) අදාළ අනෙකුත් ලෙජර ගිණුම් (ල.5)

(මුළු ලකුණු 12)

6. (i) (අ) ශේෂ පිරික්සුමක් යනු කවරක් ද?
(ආ) ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමෙන් අත්වන වාසි දෙකක් ලියන්න. (ල.2)

(ii) මූලික සටහන් පොත් වර්ගවලින් දෙකක් නම් කර ඒවායේ ගනුදෙනු සටහන් කිරීමේදී උපකාරී වන මූලාශ්‍ර එකක් බැගින් ඉදිරිපත් කරන්න (ල2)

(iii) 2019.06.30 දිනට 'අමා' ව්‍යාපාරයේ පිළියෙල කළ ශේෂ පිරික්සුම අසමාන වීම නිසා වෙනස අවිනිශ්චිත ගිණුමට රු 12600 ක් ලෙස සටහන් කර ශේෂ පිරික්සුමේදී පහත සඳහන් කරුණු අනාවරණය වූ අතර ඒවා නිවැරදි කළ විට අවිනිශ්චිත ගිණුම් පොත්වලින් ඉවත් විය.

1 රු 15000 ක විකුණුම් ඉන්වොයිසයක් සම්පූර්ණයෙන්ම පොත්වල සටහන්වී නැත

2 රු 12000 ක සේවක වැටුප් ගෙවීම් මුදල් පොතේ පමණක් සටහන් වී තිබීම

3 ණය හිමියන්ට මුදල් ගෙවීමේදී ලැබූ රු 1500 වට්ටම දුන් වටට්මක් ලෙස පිටපත් වී තිබිණි.
(ණය හිමි ගිණුම නිවැරදිය)

4 ගැණුම් ජනලයේ නිවැරදි එකතුව වූ රු 16200 ගැණුම් ගිණුමට පිටපත් වී ඇත්තේ රු 12600 ලෙසටය.
(පෞද්ගලික ණයහිමි ගිනුම් නිවැරදිය)

අවශ්‍ය වන්නේ,

වැරදි නිවැරදි කිරීමේ සටහන් පොදු ජ්නලයකින් දක්වන්න (ල.4)

(iv) බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු පියවර අනුපිළිවෙලින් ඉදිරිපත් කරන්න (ල.4)

(6 වන ප්‍රශ්නය මුළු ලකුණු 12)

07. (i) ශේෂ පිරික්සුමක අන්තර්ගතව ඇති මූලික ලෙජර ගිණුම් වර්ගවලින් හතරක් නම් කරන්න. (ල.2)

(ii) ව්‍යාපාරයක වගකීම් හා හිමිකම් ගිණුම් සම්බන්ධයෙන්

(අ) පවතින සමානකම් දෙකක්

(ආ) පවතින අසමානකම් දෙකක් ඉදිරිපත් කරන්න. (ල.2)

(iii) නාරිලතා ව්‍යාපාරය 2018.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු | බැර රු |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 560000 | |
| 2018.01.01 දිනට බඩු තොගය | 24000 | |
| ගැණුම් හා විකුණුම් | 350000 | 725000 |
| ණයගැතියෝ හා ණය හිමියෝ | 30000 | 50000 |
| 2018.01.01 දිනය ප්‍රාග්ධනය | | 300000 |
| වෙළඳ සේවක වේතන | 36000 | |
| පරිපාලන වේතන | 42000 | |
| යන්ත්‍ර උපකරණ80000 | | |
| 15 බැංකු ණය (2018.07.01 දින ලබාගත්) | | 200000 |
| ගෙවූ බැංකු ණය පොලිය | 15000 | |
| දුන් වට්ටම් හා ලැබූ වටට්ම් | 8000 | 9000 |
| කඩ කුලී | 18000 | |
| මුදල් | 124000 | |
| කොමිස් ආදායම් | | 3000 |
| | 1287000 | 1287000 |

අවශ්‍ය වන්නේ,

(අ) 2018.12.31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ල.4)

(ආ) 2018.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය (ල.4)

(7 ප්‍රශ්නයට මුළු ලකුණු 12)

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## මධ්‍ය වාර පරීක්ෂණය 2019

## 11 ශ්‍රේණිය

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

**i පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 3 | 2. 1 | 3. 1 | 4. 2 | 5. 4 | 6. 3 | 7. 3 | 8. 1 | 9. 2 | 10. 2 |
| 11. 3 | 12. 2 | 13. 4 | 14. 4 | 15. 3 | 16. 2 | 17. 4 | 18. 4 | 19. 2 | 20. 1 |
| 21. 3 | 22. 2 | 23. 3 | 24. 4 | 25. 2 | 26. 2 | 27. 1 | 28. 2 | 29. 3 | 30. 3 |
| 31. 1 | 32. 4 | 33. 3 | 34. 4 | 35. 3 | 36. 4 | 37. 1 | 38. 1 | 39. 2 | 40. 4 |

එක් නිවැරදි පිළිතුරකට ලකුණු 1 බැගි මුළු ලකුණු 40

**i කොටස**

01. i ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට ධනාත්මකව හා ඍණාත්මකව (වාසිදායක හා අවාසිදායක) <u>බලපෑම් ඇති කරන්නා වූ සියලුම සාධක හා බලවේග</u> වල එකතුව, ව්‍යාපාර පරිසරය වේ.

(ඉහත ඉරිඇඳි කොටස් පැහැදිලි වන සේ පිළිගත හැකි පිළිතුරකට ලකුණු 2 යි)

ii

| පරිසර සාධක | නිදසුන |
|---|---|
| ප්‍රජා පරිසරය | ● කාන්තාවන් රැකියා සඳහා යොමු වීම<br>● තරුණ පාර්ශවය විලාසිතාවලට ඇති යොමු වීම. |
| ආර්ථික පරිසරය | ● මිල මට්ටම ඉහළ යාම<br>● බැංකු ණය පොලී ඉහළ වීම |

(පරිසර සාධක දෙකකට ලකුණු 1/2 බැගින් ලකුණු 01)
නිදසුනකට ලකුණු 1/2 බැගින් දෙකකට ලක් 01 (02)

iii හවුල් ව්‍යාපාරය (ලකුණු 01)
● අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම (ලකුණු 01) මුළු ලකුණු 02

iv හවුල් ව්‍යාපාරය (ලකුණු 01)
● ව්‍යාපාර නාමය වසර එකක් බැවින්, ව්‍යාපාර නාම ආඥාපනතට අනුව ලියාපදිංචි කළ යුතු ය.
● ලියාපදිංචියට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කළ යුතු වේ.(එක් කරුණකට ලකුණු 1 බැගින් ලකුණු 2)

v අ. ගොඩනැගිල්ල රු 500000
මුදල් 600000
1100000
(ලකුණු 01)

ආ. වත්කම් = හිමිකම් + වගකීම්
1500000 1100000 400000
(නිවැරදි අගයන් පැවැතිය යුතුය. ලකුණු 01 = ල. 02)

vi ගොඩනැගිල්ල රු 500000
මහන මැෂින් හා උපකරණ 260000
760000 (ලකුණු 02)

vii මුදල් පොත
ගැනුම් ජ' නලය (ලකුණු 02)

viii

| | |
|---|---|
| ඍජු ද්‍රව්‍ය හා පිරිවැයඃ රෙදි නූල් හා වෙනත් ද්‍රව්‍ය | රු 300000 |
| ඍජු ශ්‍ර පිරිවැයඃ නිෂ්පාදන වැටුප් | 75000 |
| වෙනත් කම්හල් වියදම් කම්හල් විදුලිය | 24000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | 399000 |

(මුළු ලකුණු 02)

ix මුදල් ශේෂය රු 1220000

හෝ

මුදල් පොත

| | | | රු |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 600000 | මහන මැෂින් | 260000 |
| බැංකු ණය | 400000 | රෙදි හා ද්‍රව්‍ය | 230000 |
| විකුණුම් | 875000 | වැටුප් | 75000 |
| | | විදුලිය | 24000 |
| | | අලෙවිකරණ වියදම් | 46000 |
| | | ලී බඩු | 20000 |
| | | 2019. 03. 31 ප/ගෙ/ ශේෂය | 1220000 |
| | 1875000 | | 1875000 |
| ඉ/ගේ/ ශේෂය | 1220000 | | |

විසිත හා රසික ව්‍යාපාරය

ix 2019.03. 31 න් අවසන් මාස 3 සඳහා අයවැය ප්‍රකාශය

| | | |
|---|---|---|
| විකුණුම් ආදායම | | 875000 |
| අඩුකලා: නිෂ්පාදන පිරිවැය | 399000 | |
| අලෙවි කිරීමේ වියදම් | 46000 | (445000) |
| ශුද්ධ ලාභය | | 430000 |

(මුළු ලකුණු 02 යි)

02 i අ. **<u>ව්‍යාපාරික අරමුණු</u>**

ලාභ ඉපයීම/ ලාභ උපරිම කිරීම
තමාට මෙන්ම සමාජයට ද යහපතක් කිරීම
ස්කන්ධය ඉහළ දැමීම
සමාජ සුභ සාධකත්වය ඉහළ නැංවීම
අඛණ්ඩව ව්‍යාපාරික කටයුතු සාර්ථකව ගෙන යාම
පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම
රැකියා උත්පාදනය

**<u>පාරිභෝගික අරමුණ</u>**

උසස් නිෂ්පාදිත සාධාරණ මිලකට ලබා ගැනීම
පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීමට සමත් භාණ්ඩ හා සේවා පරිබෝජනයට ගැනීම
තම සුභසාධක කටයුතු ඉහළට යොමු කරවා ගැනීම.
(ව්‍යාපාරික අරමුණු හා පාරිභෝගික අරමුණු එක බැගින් දක්වා ඇත්නම් ලකුනු 1/2 බැගින් ලකුණු 01)

ආ.

| <u>ඇල්මැති පාර්ශය</u> | <u>උනන්දුවක් දැක්වීමට හේතු</u> |
|---|---|
| අයිතිකරුවෝ | ♦ ආයෝජනයට ප්‍රමාණවත් ප්‍රතිලාභයන් ලැබෙන්නේ ද?<br>♦ ව්‍යාපාරික කටයුතු සුරක්ෂිතව අනාගතයට ගමන් කරයි ද? |
| කලමණාකරුවෝ | ♦ අයිතිකරුවන්ගේ 'අරමුණු' ඉටුවන ආකාරයට කළමණාකරණ කටයුතු කිරීම.<br>♦ ව්‍යාපාරික කටයුතු සාර්ථක වීමේ තීරණ ක්‍රියාත්මක කිරීම. |
| සේවකයන් | ♦ මානව සම්පත් සමග අන්තර් සබධතාවය යහපත්ව ගෙනයාම<br>♦ සාධාරණ වැටුපක් ලබා ගැනීම<br>♦ රැකියාවේ සුරක්ෂිත බව තහවුරු කිරීම. |
| සැපයුම්කරුවෝ | ♦ අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම<br>♦ තවදුරටත් ණයට භාණ්ඩ සැපයීම<br>♦ ණය ඉක්මනින් ලබා ගැනීම |
| තරගකරුවෝ | ♦ තම නිෂ්පාදිතවල තරගකාරී මිල තීරණය කිරීම.<br>♦ ව්‍යාපාරික තරගයට මුහුණ දීම<br>♦ අලෙවි උපක්‍රම ක්‍රියාත්මක කිරීම |
| රජය | ♦ ලැබිය යුතු බදු ආදායම් රැස්කර ගැනීම<br>♦ ව්‍යාපාර තුලින් සමාජ සුභසාධන ළඟා කර ගැනීම<br>♦ ජාතික නිෂ්පාදනයට දායක කරවා ගැනීම තවත් පිළිගත හැකි දේ..... |

(පාර්ශව දෙකක් නම්කිරීම ලකුණු 1/2 යි, උනන්දුවක් දක්වන හේතුව බැගින් හේතු 2 ක් දැක්වීමට ලකුණු 1/2 යි. මුළු ලකුණු 02)

ii (අ) සත්‍යය (ආ) සත්‍යය (ඉ) සත්‍යය (ඊ) සත්‍යය

(සත්‍ය හෝ හරි පකුණු තිබිය හැකි ය. ලකුණු 1/2 බැගින් ලකුණු 2 යි)

iii මාර්ගය මාතර බෙලිඅත්ත දුම්රිය මාර්ගය
මාධ්‍යය දුම්රිය
බලය ඉන්ධන (ඩීසල්/ ගල් අඟුරු)
පර්යන්තය මාතර හෝ බෙලිඅත්ත දුම්රිය ස්ථානය

(ඉහත අන්දමට පවතීනම් එකකට ලකුනු 1/2 බැගින් ලකුණු 02)

iv අ.

| අභ්‍යන්තර පරිසරය | බාහිර පරිසරය |
|---|---|
| අයිතිකරුවන් | ණුයදෙනුකරුවන් |
| සේවකයන් | සැපයුම්කරුවන් |
| කළමනාකරුවන් | තරගකරුවන් |

(වර්ගීකරණය නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු 1/2 බැගින් ලකුණු 01)

iii ආ. 1. ධනාත්මක බලපෑම් (වාසිදායක ලෙස/ ශක්ති/ අවස්ථා ලෙස)
2. ඍණාත්මක බලපෑම් (අවාසිදායක ලෙස/ දුර්වලතා/ තර්ජන ලෙස)

(එකකට ලකුණු 1/2 බැගින් ලකුණු 01යි) 2 වැනි ප්‍රශ්නයට මුළු ලකුණු 08 යි

03. i භාණ්ඩ හා සේවා අතර වෙනස්කම්

| භාණ්ඩ | සේවා |
|---|---|
| ස්පර්ශ කළ හැකි ය | ස්පර්ශ කළ නොහැකි ය |
| භෞතික පැවැත්මක් ඇත | භෞතික පැවැත්මක් නැත. |
| ගබඩා කළ හැකිය | ගබඩා කළ නොහැක. |
| බොහෝ විට සමජාතීය වේ | සමජාතීය නොවේ. |
| සපයන්නාගෙන් වෙන්කර ලබා ගත හැකි ය | සපයන්නාගෙන් වෙන්කර ලබාගත නොහැකි ය. |

(වෙනස පාහැදිලි වන සේ දක්වා ඇති කරුණු දෙකකට ලකුණු 2 යි)

ii (අ) සත්‍යය (ආ) සත්‍යය (ඉ) සත්‍යය (ඊ) අසත්‍යය

(එකකට ලකුණු 1/2 බැගින් මුළු ලකුණු 2 යි)

iii

| බෙදාහැරීමේ ක්‍රමය | නිදසුන |
|---|---|
| 1. ඍජු බෙදා හැරීම (ඍජු අලෙවිය) | බැසිල් විසින්ම පාරිභෝගිකයාට ලබා දීම |
| 2. අතරමැදියන් මඟින් බෙදා හැරීම (වක්‍ර අලෙවිය) | සිල්ලර වෙළෙඳසැල් මගින් පාරිභෝගිකයාට ලබා දී |

(ඉහත ආකාරයට පවතීනම් එකකට ලකුණු 1/2 බැගින් ක්‍රම දෙකට හා නිදසුන් දෙකට ලකුණු 02 යි )

iv බැංකු ජංගම ගිණුමක් පවත්වා ගැනීමෙන් ව්‍යාපාරිකයකුට අත්වන වාසි

- ලැබෙන චෙක්පත් බැංකුවේ තැන්පත් කළ හැකි වීම.
- ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ හැකි වීම.
- කාලය ඉතිරි කර ගැනීමට හැකි වීම
- ආරක්ෂාව ලැබීම
- ස්ථාවර නියෝග අනුව ගෙවීම් කරවා ගත හැකි වීම
- ලැබිය යුතු අගයන් ගිණුමට රැස්කරවා ගත හැකි වීම
- අයිරා පහසුකම ලබා ගත හැකි වීම

(කරුණු 1 කට ලකුණු 1/2 බැගින් කරුණු හතරට ලකුණු 02) 03 වන ප්‍රශ්නයට මුළු ලකුණු 08

04. i අ. අණකරු

චෙක්පත් ලියා ඊට අත්සන් කරන්න.

බැංකු ජංගම ගිණුම් හිමියා

චෙක්පතට මුදල් ගෙවන ලෙස බැංකුවට විධානය සිදුකරන ජංගම ගිණුම් හිමියා

ආ. ආදායකයා

චෙක්පතේ සඳහන් මුදල ලැබිය යුතු තැනැත්තා

චෙක්පතෙන් කරනු ලබන ගෙවීම් ලබා ගැනීම. හිමිකම් ඇති චෙක්පතෙහි නම සඳහන් පුද්ගලයා.

(අදහස පැහැදිලි වන හැඳින්වීම කර ඇත්නම් ලකුණු 01 බැගින් ලකුණු 2 හිමිවේ.)

ii (අ) සත්‍යය (ආ) අසත්‍යය (ඉ) අසත්‍යය (ඊ) සත්‍යය

(එකකට ලකුණු 1/2 බැගින් ලකුණු 2 යි)

iii (අ) රක්ෂකයා : සී/ ස සුරක්ෂා රක්ෂණ සමාගම

රක්ෂිතයා : සුරංග (ලකුණු 01)

(ආ) හානිපූර්ණ රක්ෂණ මූලධර්මය (ලකුණු 01)

iv
- භාණ්ඩයේ ස්වභාවය
- ප්‍රවාහන පිරිවැය
- ආරක්ෂාව
- වේගය
- සුලභතාව
- ධාරිතාව (කරුණු 1 කට ලකුණු 1/2 බැගින් කරුණු 4 කට ලකුණු 2 යි)

05. i (අ) ව්‍යාපාර ගනුදෙනුවක ද්විත්ව ප්‍රතිපලය නිවැරදිව එකවර ගිණුම් දෙකක හර හා බැර ලෙස සටහන් කිරීමේ ක්‍රමය ද්විත්ව සටහන් තැබීමේ ගිණුම් ක්‍රමය වේ (ලකුණු 01)

(ආ) ආදායම් ගිණුම්

හිමිකම් ගිණුම්

වගකීම් ගිණුම් (දෙකකට ලකුණු 01 යි) මුළු ලකුණු 02 යි

ii ගැණුම් ජ'නලය

| දිනය | ඉන්වොයිස් | සැපයුම්කරු | වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| 2019. 06. 12 | 145 | ගීතා | 7200 | |
| 2019. 06. 20 | 82 | සුනිමල් | 19000 | |
| 2019. 06. 30 | | ගැණුම් ගිණුමට හර කළා | 26200 | |

(ලකුණු 02)

iii අ.

| දිනය | භාණ්ඩ තොග | ණය ගැතියෝ | මුදල් | හිමිකම් | බැංකු ණය | ණය හිමියෝ |
|---|---|---|---|---|---|---|
| 2019. 06. 01 | 24000 | 26000 | 35000 | 30000 | 40000 | 15000 |
| 2019. 06. 03 | +12000 | | | | | +12000 |
| 2019. 06. 08 | | | 8000 | 8000 | | |
| 2019. 06. 12 | | 5000 | +5000 | | | |
| | 36000 | 21000 | 29000 | 27000 | 32000 | 27000 |

(ගණු දෙනුවක බලපෑම් දෙක + සහ  ලෙස නිවැරදින සටහන් කර ඇත්නම් ලකුණු 1/2 බැගින් ලකුණු 2 යි)

(ආ) වත්කම් = හිමිකම් + වගකීම්

86000 = 27000 + 59000 (මුළු ලකුණු 03)

iv

| දිනය | ලදු. | විස්තරය | වට්ටම් රු | මුදල් | දිනය | ව අ | විස්තරය | වට්ටම් රු | මුදල් රු |
|---|---|---|---|---|---|---|---|---|---|
| 06. 01 | | ඉ/ගෙ/ ශේෂය | | 80000 | 06.18 | 15 | පියල් | 300 | 5700 |
| 06. 08 | 35 | කල්පනී | 400 | 7600 | 06.25 | 16 | අනිල් | 500 | 4500 |
| 06. 15 | 36 | තාරකා | 600 | 5400 | | | | | |
| | | | 1000 | | | | | 900 | |

(වට්ටම් හා මුදල් හා වටිනාම දෙකටම ලකුණු 1/2 බැගින්)

කල්පනී (ණයගැති)

| දිනය | විස්තරය | ස. පි | මුදල රු | දිනය | විස්තරය | ස. පි. | මුදල රු |
|---|---|---|---|---|---|---|---|
| 06. 01 | ඉ/ගෙ/ ශේෂය | | 30000 | 06. 08 | මුදල් | | 7600 |
| | | | | 06. 08 | දුන් වට්ටම් | | 400 |

තාරකා (ණයගැති)

| දිනය | විස්තරය | ස. පි | මුදල රු | දිනය | විස්තරය | ස. පි. | මුදල රු |
|---|---|---|---|---|---|---|---|
| 06. 01 | ඉ/ගෙ/ ශේෂය | | 20000 | 06. 15 | මුදල් | | 5400 |
| | | | | 06. 15 | දුන් වට්ටම් | | 600 |

පියල් (ණයහිමි)

| දිනය | විස්තරය | ස. පි | මුදල රු | දිනය | විස්තරය | ස. පි. | මුදල රු |
|---|---|---|---|---|---|---|---|
| 06. 18 | මුදල් | | 5700 | 06. 15 | ඉ/ගෙ/ශේෂය | | 46000 |
| 06. 18 | ලැබූ වට්ටම් | | 300 | | | | |

අනිල් (ණයහිමි)

| දිනය | විස්තරය | ස. පි | මුදල රු | දිනය | විස්තරය | ස. පි. | මුදල රු |
|---|---|---|---|---|---|---|---|
| 06. 25 | මුදල් | | 4500 | 06. 15 | ඉ/ගෙ/ශේෂය | | 34000 |
| 06. 25 | ලැබූ වට්ටම් | | 500 | | | | |

දුන් වට්ටම් ගිණුම

| දිනය | විස්තරය | ස. පි | මුදල රු | දිනය | විස්තරය | ස. පි. | මුදල රු |
|---|---|---|---|---|---|---|---|
| 06. 25 | ණයගැති | | 1000 | | | | |

ලැබූ වට්ටම් ගිණුම

| දිනය | විස්තරය | ස. පි | මුදල රු | දිනය | විස්තරය | ස. පි. | මුදල රු |
|---|---|---|---|---|---|---|---|
| | | | | 06. 30 | ණයහිමි | | 900 |

( 5 ප්‍රශ්නයට මුළු ලකුණු 12 කි)

064. i අ. ලෙජර ගිණුම්වල හර හා බැර ශේෂ අතුළත් කර පිළියෙල කරන ලේඛණය, ශේෂ පිරික්ෂුම වේ. (ලකුණු 01)

ආ ගිණුම් පිළියෙල කිරීමේ ගණිතමය නිවැරදිව තහවුරු කරගත හැකි වීම.

ශේෂ පිරික්සුමේ අසාමානතාවය තුලින් නැවත ගිණුම් පිළියෙල කළ ආකාරය පිළිබඳව සෝදිසි කිරීමක් කර නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ඉඩකඩ ලැබීම.

ලෙජර් ගිණුම්වල ශේෂ එක්රැස් වන නිසා ශේෂ පිරික්සුම සාරාංශ ගත ලේඛණයක් ලෙස සැලකීමට හැකි වීම

(වාසි එකකට ලකුණු 01 මුළු ලකුණු 02)

ii

| මූලික සටහන් පොත් | මූලාශ්‍ර ලේඛන |
|---|---|
| ගැනුම් ජ'නලය | ගැනුම් ඉන්වොයිසිය |
| විකුණුම් ජ'නලය | විකුණුම් ඉන්වොයිසිය |
| මුදල් පොත | ලදුපත් හෝ වවුචර් |
| සුළු මුදල් පොත | සුළු මුදල් වවුචරය |
| පොදු ජ'නලය | ජ'නලය වවුචරය |

(මූලික සටහන් පොත් දෙකක් නම් කිරීමට ලකුණු 1/2 බැගින් ලකුණු 01) ලේඛන එකක නිවැරදිව දක්වූ විට ලකුණු 1/2 බැගින් ලකුණු 01 යි මුළු ලකුණු 02)

iii පොදු ජ'නලය

| දිනය | ජ'නල් ව. අංකය | විස්තරය | ලෙ පි | හර රු | බැර රු |
|---|---|---|---|---|---|
| | | ණයගැති ගිණුම හර<br>විකුණුම් ගිණුම<br>(රු15000 විකුණුම් ඉන්වොයිසිය සටහන් නිවැරදි කිරීම) | | 15000 | 15000 |
| | | සේවක වැටුප් ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(රු. 12000 සේවක වැටුප් ගෙවීම්, වැටුප් ගිණුමේ සටහන් නොවීම නිවැරදි කිරීම) | | 12000 | 12000 |
| | | අවිනිශ්චිත ගිණුම හර<br>දුන් වට්ටම් ගිණුම<br>ලැබූ වට්ටම්<br>(රු. 1500 ලැබූ වට්ටම්, දුන් වට්ටම් ලෙසට සටහන් වීම නිවැරදි කිරීම) | | 3000 | 1500<br>1500 |
| | | ගැණුම් ගිණුම හර<br>අවිනිශ්චිත ගිණුම<br>(ගැනුම් ජ'නලයක් එකතුව වූ රු 16200 ගැනුම් ගිණුමේ 12600 ලෙස සටහන්වීම නිවැරදි කිරීම) | | 3600 | 3600 |

(සංලක්ෂණ සමඟ නිවැරදි ජනල් සටහනකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04)

iv පියවර

1. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශයේ ශේෂය සමාන වී තිබේද? යන්න බැලීම
2. ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හා බැංකුවෙන් එවා ඇති බැංකු ප්‍රකාශයේ දක්වෙන තොරතුරු සැසඳීම තුළින් ශේෂයන් ශේෂ වෙනසට බලපෑ හේතු අනාවරණය කර ගැනීම.
3. බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.
4. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම. (සංශෝධිත බැංකු ශේෂය යොදා ගනිමින්)

(එක් කරුණකට ලකුණු 1 බැගින් කරුණු හතරට ලකුණු 04 යි) 6 වන ප්‍රශ්නයට මුළු ලකුණු 12 යි)

07. i වත්කම් ගිණුම
වියදම් ගිණුම
හිමිකම් ගිණුම්
ආදායම් ගිණුම්
වගකීම් ගිණුම (එක් ගිණුම් වර්ගයකට ලකුණු 1/2 බැගින් වර්ග 4 ට ලකුණු 2 යි)

ii (අ) වගකීම් හා හිමිකම් ගිණුම් සම්බන්ධයෙන්
පවතින සමානකම්
ගිණුම් වර්ග දෙකේම බැර ශේෂයන් පැවතීම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සටහන් වීම
වැඩිවීම බැරටත්, අඩුවීම හරටත් සටහන් වීම.
(සමානකම් 1කට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01 යි)

(ආ) වගකීම් හා හිමිකම් ගිණුම අතර පවතින අසමානකම්

| වගකීම් ගිණුම | හිමිකම් ගිණුම |
|---|---|
| ව්‍යාපාරය විසින් බාහිර පාර්ශවනට ඇති බැදීම් පෙන්නුම් කෙරේ. | අයිතිකරුවන්ගේ හිමිකම් පෙන්නුම් කෙරේ. |
| ශුද්ධ ලාභය, වගකීම් වලට ඇතුළත් නොකරයි. | ශුද්ධ ලාභය ප්‍රාග්ධනයට එකතු වී හිමිකම සකස් වේ. |
| ව්‍යාපාරය විසින් නිශ්චිත කරගත් දිනකදී වගකීම් නිදහස් කළ යුතු වේ. | ව්‍යාපාරය විසුරුවා හරින තෙක්ම හිමිකම පවතී. |

(අසමානකම් 1 කට ලකුණු 1/2 බැගින් කරුණු දෙකකට ලකුණු 01) මුළු ලකුණු 02

ii අ. නාරිලතා ව්‍යාපාරය
2018. 12. 31 න් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය

| | | රු |
|---|---|---|
| විකුණුම් | | 725000 |
| <u>අඩුකලා විකුණුම් පිරිවැය</u> | | |
| 2018. 01. 01. තොග ගැනුම් | 24000 | |
| ගැනුම් | 350000 | (374000) |
| | | 351000 |
| දළ ලාභය | | |
| <u>වෙනත් ආදායම්</u> | | |
| ලැබූ වට්ටම් | 9000 | |
| කොමිස් ආදායම් | 3000 | 12000 |
| | | 363000 |
| <u>අඩුකලා බෙදාහැරීමේ වියදම්</u> | | |
| වෙළඳ සේවක වේත. | 36000 | |
| දුන් වට්ටම් | 8000 | (44000) |
| <u>පරිපාලන වියදම්</u> | | |
| පරිපාලන වේතන | 42000 | |
| කඩකුලී | 18000 | (60000) |
| <u>මූල්‍ය වියදම්</u> | | |
| බැංකු ණය පොලී | | (15000) |
| ශුද්ධ ලාභය ප්‍රා/ ගිණුමට බැර කළා | | 244000 |

(මුළු ලකුණු 4 යි)

අ. නාරිලතා ව්‍යාපාරය
2018. 12. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | | රු |
|---|---|---|
| <u>ජංගම නොවන වත්කම්</u> | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 560000 | |
| යන්ත්‍ර උපකරණ | 80000 | |
| | | 640000 |
| <u>ජංගම වත්කම්</u> | | |
| ණය ගැතියෝ | 30000 | |
| මුදල් | 124000 | 154000 |
| | | 794000 |
| <u>හිමිකම් හා වගකීම්</u> | | |
| 2018. 01. 01 දිනට ප්‍රාග්ධනය | 300000 | |
| එකතු කළා ශුද්ධ ලාභය | 244000 | 544000 |
| <u>ජංගම නොවන වගකීම්</u> | | |
| 15% බැංකු ණය | | 200000 |
| <u>ජංගම වගකීම්</u> | | |
| ණය හිමියෝ | | 50000 |
| | | 794000 |

වත්කම් හා වගකීම් නිසි ලෙස වර්ගීකරණය කර ඇත්නම් ලකුණු 1/2 ක් දෙන්න. මුළු ලකුණු 04
(07 ප්‍රශ්නයට මුළු ලකුණු 12 යි)

සැලකිය යුතුයි : ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තිරස් ආකෘතිය අනුවද සකස් කළ හැකි ය. ඊට අදාළ ලකුණු දෙන්න.